# වයඹ පළාත් සභාව 2021 වර්ෂය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වයඹ පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 නොවැම්බර් 28 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර වයඹ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව තවදුරටත් ලැබිය යුතු උසාවි ගාස්තු හා දඩ මුදල් සහ මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එලෙස සමාලෝචිත වර්ෂයට අදාළව 2022 වර්ෂයේ ලැබී තිබුණු උසාවි ගාස්තු හා දඩ මුදල් සහ මුද්දර ගාස්තු ආදායම් පිළිවෙලින් රු.107,157,442 ක් හා රු.340,745,508 ක් විය. | සමාලෝචිත වර්ෂයට අදාල ලැබීමට නියමිත උසාවි දඩ හා ගාස්තු ඊළඟ වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර ලබා දෙන ලෙස අදාල අධිකරණ වෙතින් ඉල්ලීම් කර ඇත. එමෙන්ම මුද්දර ගාස්තු ආදායම් පිළිබඳවද යම් ක්‍රමවේදයක් සකස් කිරීමට පළාත් ආදායම් කොමසාරිස් සමඟ සාකච්ඡා කරමින් ඇත. | වර්ෂයට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සාත්තු නිවාස හා පෞද්ගලික ආරෝග්‍ය ශාලා ලියාපදිංචි ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම වූ රු.1,516,750 ක් හා ලැබිය යුතු ආදායම වූ රු.8,525,240 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | පෞද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව විසින් පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ආදායම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ විශේෂ ගිණුමකට බැර කරයි. මෙම මුදල පළාත් සභා ආදායමට බැර කරන ලෙස වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා දැනුවත් කර ඇත. | මෙම ආදායම පළාත් සභා ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු උසාවි ගාස්තු හා උසාවි දඩ මුදල් රු.98,489,013 ක් සහ මුද්දර ගාස්තු රු.107,685,317 ක් වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව සඳහන් කරමි. | වර්ෂය අවසානයට පවතින වගකීම් මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | පළාත් සභා මූල්‍ය ප්‍රකාශන හා ඒ ඒ වැය ශීර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ ශේෂ අතර වැය ශීර්ෂයන් දෙකකට අදාළව ස්ථාවර වත්කම් යටතේ එකතු වටිනාකම රු.84,333,580 ක නොසැසඳීමක් විය. | ප්‍රධාන අමාත්‍යාංශයට අයත් වාහනයක අගය රු.67,500,000 කින් වැඩියෙන් සටහන් වීම හා ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ ආරම්භක ශේෂය රු.16,833,580 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොවීම මීට හේතු වී ඇත. | වත්කම් නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |
| (ඉ) | වැය ශීර්ෂ දෙකකට අදාළව ස්ථාවර වත්කම් යටතේ වත්කම් ප්‍රත්‍යාගණිත අගය වූ රු.565,238,100 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | පළාත් සමුපකාර දෙපාර්තමේන්තුවේ වාහනවලට අදාළ රු.11,665,000 ක තක්සේරු අගයක් අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොමැති බවත් පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඉඩම්වලට අදාළ රු.553,573,100 ක් වූ තක්සේරු අගයක් සඳහා පළාත් භාණ්ඩාගාරය ලබාදෙන උපදෙස් මත ඉදිරියේදී කටයුතු කරනු ඇත. | වත්කම් ප්‍රත්‍යාගණිත අගයන් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද රු.11,334,155 ක ඉදිකිරීම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | මෙම වසරේදී අදාළ ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | වත්කම් නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | වයඹ පළාත් නිවාස හා ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ රු.1,682,550 ක පරිගණක උපකරණවල අගය මූල්‍ය ප්‍රකාශනවලට රු.337,550 ක් ලෙස රු.1,345,000 ක් අඩුවෙන් ගෙන තිබුණි. | රාජ්‍ය අංශවල මූල්‍ය නොවන වත්කම් ප්‍රත්‍යගණනය කිරීමේ කටයුතු මෙම වසර තුළ සිදුකිරීමටත් ඒ අනුව වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම හා ඊට අනුකූලව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය යටතේ ඇතුලත් කිරීමටත් පියවර ගනු ඇත. | වත්කමේ වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළව පැවති ගොඩනැගිලි හා ඉදිකිරීම්, ඉඩම් සහ මෝටර් රථවල වටිනාකම් පිළිවෙලින් රු.19,623,580 ක්, රු.153,094,463 ක් හා රු.79,250,000 ක් අඩුවෙන් හා යන්ත්‍රෝපකරණවල වටිනාකම රු.59,285,535 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. | අදාළ උපලේඛන සමඟ සසඳා ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වත්කමේ වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, වයඹ පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාත්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 201 - වයඹ ආණ්ඩුකාරවරයා

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 ජූලි 01 දින අනතුරකට ලක්ව තිබුණු නිල රථයක් සම්බන්ධව හෙළිදරව් කිරීම් පාඩු හා හානි ලේඛනයන්හි සහ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. එසේම මෙම අනතුර සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණ වාර්තා අනුව අදාළ රියදුරුගෙන් අයකළ යුතු මුදල රු.1,420,728 ක් විය. | මෙම මුදල 2022 මාර්තු 31 දිනට ප්‍රථම ගෙවන ලෙස රියදුරු වෙත ලිඛිතව දන්වා ඇතත් ඒ සඳහා පිළිතුරුක් නොවූ හෙයින්, රියදුරුට විරුද්ධව නීතිමය කටයුතු කර එම මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | විමර්ශන වාර්තාව අනුව කටයුතු කළ යුතුය. |

**1.5.2 ශීර්ෂය - 202 - වයඹ පළාත් සභාව**

**මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා පනතින් බලය ලබාදී නොතිබියදී හිටපු පාර්ලිමේන්තු අමාත්‍යවරයෙකුගේ අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් රු.200,000 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. | 2021 වර්ෂය සඳහා කාර්යාලයට ලද ප්‍රතිපාදන මඟින් ගෙවීම් කිරීමේ හැකියාවක් නොමැති බැවින්, පළාත් භාණ්ඩාගාරය විමසා පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන වෙන්කරවා ගෙන ගෙවීම් කටයුතු කරන ලදී. | වියදම් දැරීම පළාත් සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**1.5.3 ශීර්ෂය - 203 - වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විභාග පැවැත්වීමට අදාල අයදුම්පත් කැඳවීම, විභාග ප්‍රශ්ණ පත්‍ර සැකසීම, විභාග මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරවීම, ප්‍රශ්ණ පත්‍ර ඇඟයීම, ප්‍රතිඵල නිකුත් කිරීම ආදී වූ පාලන ක්‍රමවේද විධිමත් කිරීමට අවශ්‍ය කාර්ය පටිපාටීන් ස්ථාපිත කර නොතිබුණි. | වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග කාර්ය පටිපාටිය සකස් කිරීම අවසන් අදියරේ පවතින අතර එය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව වයඹ ප්‍රධාන ලේකම් මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව වාර්තා කරමි. | විභාග පැවැත්වීමට අදාළ අයදුම්පත් කැඳවීමේ සිට ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රියාවලිය දක්වා පවතින පාලන ක්‍රමවේද ස්ථාපිත කර විධිමත් අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතුය. |

**1.5.4 ශීර්ෂය 210 - වයඹ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා**

**(අ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ ජනකලා කේන්ද්‍රයේ ශ්‍රවනාගාරය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව උපදේශාත්මක සේවා | ගිවිසුමට අනුව වයඹ ජනකලා පදනමේ සමස්ථ භූමි සැලැස්මක් යටතේ නැවත සංවර්ධනය කිරීමේ | ගිවිසුම්ගත කාලය තුළදී අදාළ කාර්යයන් ඉටු කරවා ගැනීමට |

| | | |
|---|---|---|
| ලබාගැනීම සඳහා උපදේශක ආයතනයක් සමඟ 2016 අගෝස්තු 24 දින ප්‍රධාන අමාත්‍යාංශය අතර වූ ගිවිසුම අනුව සැලසුම් සකස් කිරීම, කොන්ත්‍රාත් ලියවිලි සකස් කිරීම හා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම 2016 නොවැම්බර් 27 දින වන විට සිදුකර ඉදිකිරීම් අවසන් කිරීම 2017 නොවැම්බර් 27 දින වන විට සිදුකළ යුතු වුවත්, 2018 වර්ෂයේ සැප්තැම්බර් දක්වා සැලසුම් ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් ඉදිකිරීම් අවසන් කිරීමට 2019 ජුලි 23 දින දක්වා කාලය ගතවීම මත මිල වැඩිවීම් ලෙස රු.3,635,538 ක් ගෙවීමට සිදුව තිබුණු අතර රු.4,940,000 ක ප්‍රමාද ගාස්තුවක් ද අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා ගෘහ නිර්මාණ සැලැසුම් සකස් කර ඒ් සඳහා ව්‍යුහ සැලසුම් සකස් කරන අවස්ථාවේදී මුලින් ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් ආරම්භ කළ යුතු බව තීරණය විය. මේ හේතුවෙන් ශ්‍රවණාගාරයේ ගෘහ නිර්මාණ සැලසුම් හා ව්‍යුහ සැලසුම් සකස් කිරීම ප්‍රමාද විය. | කටයුතු කළ යුතුය. |

(ආ) අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්

---------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම, විවිධාංගීකරණය කිරීම, ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුණුගත කාර්යයන්ගෙන් පරිබාහිරව වයඹ පළාතේ අධ්‍යාපන කාර්යාල 08 ක Payroll පද්ධතිය සඳහා රු.4,988,880 ක් වැය කර Epson DF X 9000 වර්ගයේ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 08 ක් මිලදීගෙන තිබුණි. | පළාත් හා කලාප කාර්යාල සඳහා ඩොට් මෙට්‍රික්ස් මුද්‍රණ යන්ත්‍ර මිලදීගෙන ඇත්තේ ගුරුවරුන් සඳහා වැටුප් පත්‍රිකා නිකුත්කිරීමේ අවශ්‍යතාව සම්පූර්ණ කිරීමටයි. මෙම අවශ්‍යතාව DLI 8 යටතේ ගුරුවරුන්ගේ වැඩකිරීමේ ධාරිතාව ඉහල නැංවීම යන අවශ්‍යතාව මත ඉටුකරන ලද්දකි. මෙම පහසුකම් සැපයීම මඟින් ගුරුවරුන් තෘප්තිමත් ලෙස සේවයේ යෙදීම අපේක්ෂා කෙරිණි. | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහාම වූ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය. |

**1.5.4.1 වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

---------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන මඟින් පරිපාලනය වන පෙර පාසල් හා පෞද්ගලික පෙර පාසල්වල ප්‍රමිතීන් නියම කිරීමට හා ඒ සඳහා කළමනාකරණ ප්‍රමිතීන් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. | මීට අදාළ ප්‍රඥප්තියේ සංශෝධන සකස් කර ඇතත් දැනට පළාත් සභා විසුරුවා ඇති බැවින් නැවත සංශෝධනය කර ගැනීමට හැකියාවක් නොමැත. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් වූ විගස ප්‍රඥප්තිය සංශෝධනය කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රඥප්ති සංශෝධනයන් අවශ්‍ය පරිදි සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ මුද්‍රණය කළ පෙර පාසැල් වැඩ පොත් වලින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රයෝජනයට නොගත් රු.1,685,056 ක පෙරපාසැල් වැඩ පොත් ඉතිරි තොගයක් විය. | මෙම පොත් තොගය ළමුන් අතර නොමිලයේ බෙදා දීමට හෝ අලෙවි කිරීමට නොහැකි හෙයින් වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කළමනාකරණ මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත. එම සමීක්ෂණය කළ පසු කඩිනමින් පොත් ළමුන් අතර බෙදා දීමට කටයුතු කරනු ඇත. | අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව වැඩපොත් මුද්‍රණය කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.4.2 වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශයේ එකතුව රු.128,146,550 ක් වූ වත්කම්, වගකීම් 18 ක් සනාථ කිරීම සඳහා වූ සාක්ෂි මූලා‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දැක්වීමක් සිදු කර නොමැත. | මූලා‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශේෂ සනාථ කිරීම් හා කාල විශ්ලේෂණ නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

**1.5.4.3 වයඹ ජනකලා පදනම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පදනමේ අරමුණ වයඹ පළාත් පාරම්පරික කලාශිල්ප ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම, එබඳු කර්මාන්ත නංවාලීම වුවද සමාලෝචිත වර්ෂය තුළ පදනම විසින් මිලදීගත් මුළු භාණ්ඩවලින් සියයට 34 ක් ලෙස රු.1,389,470 ක් වයඹ පළාතෙන් පිට සැපයුම් කරුවන්ගෙන් මිලදීගෙන තිබුණි. | පිත්තල, ලෙදර්, බතික් වැනි නිෂ්පාදකයින් වයඹ පළාතේ නොමැති නිසාත් වැඩි මිලකින් යුක්ත භාණ්ඩ වයඹ පළාතට පිටතින් මිල දී ගැනීමට සිදුව ඇත. | ප්‍රඥප්ති ප්‍රකාරව වයඹ පළාතේ පාරම්පරික කලාශිල්ප ආරක්ෂා කිරීම හා එවැනි නිෂ්පාදන ව්‍යාප්ත කිරීම මූලික අරමුණු කොට ක්‍රියා කළ යුතුය. |

**1.5.4.4 වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් බැංකු ගිණුම් 09 ක් පවත්වාගෙන යනු ලබන අතර, එම ගිණුම් අතර විධිමත් මුදල් කළමනාකරණය සිදුනොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට | චක්‍රිය ණය වැඩසටහන යටතේ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වන බැවින් මෙලෙස බැංකු ගිණුම් පවත්වාගෙන යන අතර ආරක්ෂක සහ පවිත්‍රතා සේවයට අදාළව සෑම | අවශ්‍යතාවයන් පරිදි බැංකු ජංගම ගිණුම් කටයුතු පාලනය කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | අධිකාරිය සතු ශුද්ධ මුදල් ශේෂය රු.42,771,486 ක් වුවත්, එදිනට රු.13,318,195 ක බැංකු අයිරාවක් එක් ගිණුමක පවතින අතර එම අයිරාවට පොලිය හා බැංකු ගාස්තු ලෙස රු.1,343,876 ක මුදලක් අධිකාරියට දැරීමට සිදු වී තිබුණි. | මසකම 10 වන දින වැටුප් ද මාසයේ අවසාන දිනට පෙර අර්ථසාධක අරමුදල්ද ගෙවිය යුතු වුවත්, රාජ්‍ය ආයතනවලින් නියමිත දිනට මුදල් නොලැබෙන බැවින් බැංකු අයිරා පහසුකම ලබා ගැනීමට සිදුවී ඇත. | |
| **(ආ)** | අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් ආදායම් වන ආරක්ෂක සේවා හා පවිත්‍රතා සේවා යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.7,130,611 ක හා රු.36,717,314 ක හිඟ ආදායමක් විය. | අප සේවා පහසුකම් සපයනු ලබන්නේ ඉතාම දිළිඳු ජන කොටස් වලට වන අතර එම ජන කොටසට රටේ සිදු වන ආර්ථික හා සමාජීය බලපෑම් ක්ෂණිකව දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි. වර්තමානයේ අප මුහුණ දී ඇති ආර්ථික අර්බුදය හමුවේ වුවද පවතින හිඟ ආදායම් අය කර ගැනීම සඳහා ක්‍රියාවලි අනුගමනය කරනු ඇත. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.4.5 වයඹ පරිසර අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ රසඥ තනතුර, අනුමත කාර්ය මණ්ඩලයෙහි තනතුරක් වුවත්, එම තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ බැවින් රසායනාගාර කටයුතු සඳහා මිලදීගෙන තිබුණු රු.2,208,000 ක් වටිනා රසායනාගාර උපකරණ වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අදහස් දැක්වීම් සිදු කර නොමැත. | අදාළ තනතුර සම්පූර්ණ කිරීමට හා උපකරණ ප්‍රයෝජනවත් කාර්යයට යෙදවීමට කටයුතු කළ යුතුය. |

**1.5.4.6 වයඹ සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | දෙස් විදෙස් සංචාරකයන්ට වයඹ පළාත තුළ හිතකර පරිසරයක් ගොඩනැඟීමේ අරමුණින් 2014 වර්ෂයේ රු.මිලියන 53.3 ක් වැය කර අධිකාරිය විසින් ඉදිකරන ලද සංචාරක මධ්‍යස්ථානය වසර 05 කට වැඩි කාලයක සිට කිසිදු ආදායමක් උත්පාදනය කර ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | ''Colombo Sanctuary Resort'' පුද්ගලික ආයතනයට වර්ෂ 10 ක කාලයක් සඳහා බදුදීමට කටයුතු කළද, ජල ගැටළුව හේතුවෙන් නව ජල සැපයුමක් ලබාගෙන ඉතිරි ඉදිකිරීම් අවසන් කරන තෙක් මෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වී ඇත. | වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | අධිකාරියට අයත් "පුත්තලම මැරිටයිම් හෙරිටේජ්" නිවාඩු නිකේතනය සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.1,162,183 ක වියදමක් දරා තිබුණ ද උපයා ඇති ආදායම රු.202,620 ක් පමණක් විය. | මෙම ගොඩනැගිල්ල නාවික හමුදාවේ නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන යාම සඳහා බදු දීමට යෝජනා වූ අතර, ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය එකඟතාවය පල කළ අතර, ඊට අදාල ලිපිය මේවන විට නාවික හමුදා මූලස්ථානයට යොමු කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් ඇත. | සංචාරක නිකේතනය ලාභ උපයන තත්ත්වයට පත් කර ගැනීමට හෝ බදු දීමට කටයුතු කළ යුතුය. |

**1.5.4.7 වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් පනත ප්‍රකාරව නිශ්චිත ගාස්තු මත අයකල බදු මුදල් අයකල මසට පසුව එළඹෙන මාසයේ 15 දින හෝ එයට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට හා ඊට පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු එකතුව රු.10,204,725 ක බදු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් පනත අනුව අයකළ බදු මුදල් වලින්, ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ආයතනයේ වර්තමානයේ පවතින මූල්‍ය දුෂ්කරතා මත ගෙවීම මගහැර ඇති අතර තත්වය යහපත් වූ විගස ගෙවීම් කටයුතු කරනු ඇත. | නියමිත කාලය තුළ බදු මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති ණයගැති ශේෂය වූ රු.66,166,834 තුළ 2004 වසරට පෙර සිට පැවත එන රු.7,049,985 ක හිඟ මෙහෙයුම් ආදායමක් සහ වසර 2009 – 2012 කාල පරිච්ඡේදයට අදාළ එකතුව රු.739,755 ක හිඟ අලුත්වැඩියා ආදායමක් විය. | හිඟ මුදල දිගින් දිගටම අය නොවන ණය ශේෂ ලෙස ගිණුම් වල පවතින බැවින්, පළාත් භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගෙන ගිණුම්වලින් අඩු කිරීමට කටයුතු කරනු ඇත. | හිඟ ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**1.5.5 ශීර්ෂය 211 – වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණකාධිපති විසින් 2009 වර්ෂයේදි නිකුත් කර තිබූ රු.1,283,900ක් වූ අධිභාර 04 ක් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට අදාළව පනවා ඇති අධිභාර සම්බන්ධ අභියාචනා පිළිබඳ පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ ඇතුළත් වාර්තාව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, ඒ පිළිබඳව දැනුම් දෙන තීරණ අනුව ඉදිරි කටයුතු සිදු කරමි. | අධිභාර සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග අප්‍රමාදව ගත යුතුය. |

**1.5.6 ශීර්ෂය 212 - වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ පාර්ශවයන් විසින් අවස්ථා 28 කදී දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති එකතුව රු.7,723,055 ක තැන්පත් මුදල් අවුරුදු 02 සිට 04 දක්වා කාලයක් ගතව තිබුණද, ව්‍යාපෘතිවලට අදාළ අඩුපාඩු සකස් කර ගැනීමට හෝ එසේ නොමැතිනම් අදාළ පාර්ශවයන්ට ආපසු ගෙවීමට හෝ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අදාළ ඇස්තමේන්තුවලින් බොහෝමයක් මේ වන විට නිදහස් කර ඇති අතර 2022 අප්‍රේල් 30 වන විට තැන්පතු 28 කට අදාළව රු.7,723,055 ක් පමණක් තැන්පත් ගිණුමේ ඇත. මෙම ශේෂ අදාළ ඉදිකිරීම් ව්‍යාපෘතිවල පවතින අඩුපාඩු සකස් කිරීමට වේ. | ව්‍යාපෘතිවල පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.7 ශීර්ෂය 213 - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට පැවති එකතු වටිනාකම රු.5,202,393 ක සිද්ධි 32 ක තුළ වසර 10 ඉක්ම වූ එකතු වටිනාකම රු.871,370 ක් වූ සිද්ධි 04 ක් ද ඇතුලත්ව තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විශ්‍රාමික නිලධාරියෙකුට අදාළ රු.199,370 ක් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ දැනුවත් කිරීමටද, රු.12,000 ක අලාභය පොතෙන් අස් කිරීමටද කටයුතු කර ඇති අතර රු.660,000 ක් වූ පරිගණක සොරා ගැනීමට අදාළ අලාභය සම්බන්ධයෙන් මෙතෙක් තීරණයක් ගෙන නොමැත. | අදාළ තීරණ ගැනීම නොපමාව සිදු කර අලාභයන් අයකර ගත යුතුය. |

**(ආ) නොවිසඳී ඇති විගණන ඡේද**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ 2007 – 2010 කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති රු.මිලියන 13.18 ක මුදල් වංචාවට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගෙන පළාත් සභාවට අයවිය යුතු අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වංචාවට වගකිව යුතු එක් පාර්ශවයක් වන ගිරිඋල්ල මහජන බැංකුව සමඟ මුදල් අය කර ගැනීම සම්බන්ධව සාකච්ඡා පවත්වමින් පවතින බව කාරුණිකව දන්වමි. | අලාභ අය කර ගැනීමට හා වගකිව යුතු පාර්ශවයන්ට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ 2007 - 2012 කාල පරිච්ඡේදය තුළ පොදු හා ගුරු වැටුප් ජංගම ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් සකස් නොකිරීම සම්බන්ධ විශේෂ විමර්ශන වාර්තාවේ නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විශේෂ විමර්ශන වාර්තාවේ දැක්වෙන පරිදි අදාළ බැංකු ගිණුම් මෙහෙයවීම හා එම ක්‍රියාවලියෙහි සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් ඍජුව හා වක්‍රව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත භාර දී ඇත. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීම හා අදාළ ක්‍රියා මාර්ග ගැනීම කඩිනම් කළ යුතුය. |

**(ඇ)** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------------- | ------------ |
| **(i)** | මහව අධ්‍යාපන කලාප බල ප්‍රදේශය තුළ වසර 06 කට වඩා වැඩි කාලයක් එකම පාසලේ විදුහල්පති ලෙස සේවය කරන විදුහල්පතිවරු 77 දෙනෙකු සිටින අතර එයින් එකම පාසලේ සේවා කාලය වසර 20 ට වඩා වැඩි විදුහල්පතිවරු 04 දෙනෙකු හා වසර 10 ට වැඩි විදුහල්පතිවරු 53 දෙනෙකු විය. | අදාළ පාසල් වර්ගය අනුව විදුහල්පති ශ්‍රේණිධාරීන් තුලනය කිරීම සඳහා උපදෙස් සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී ඇත. | නිශ්චිත ස්ථනමාරු ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. |
| **(ii)** | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ (රේඛීය) 2021 අප්‍රේල් 28 දිනැති අංක 06/2021 චක්‍රලේඛය ප්‍රකාරව සිටිය යුතු අධ්‍යන කාර්ය මණ්ඩලය යටතේ හලාවත කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශයට අදාළ පාසැල්වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙහි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 324 ක්, 37 ක් හා 36 ක් සහ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හා සහකාර විදුහල්පති තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 41 ක්, 43 ක් හා 45 ක් විය. | පළාත තුළ පවතින සියලුම ගුරු පුරප්පාඩු සඳහා නවක ගුරුවරු බඳවා ගැනීමට වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත සහ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. | පුරප්පාඩු/ අතිරික්තතා කළමනාකරණය කර අධ්‍යාපන කටයුතුවලට වන බාධක අවම වන සේ පවත්වාගෙන යා යුතුය. |
| **(iii)** | මහව කලාප අධ්‍යාපන බලප්‍රදේශයේ පාසැල් 55 ක අනුමත විදුහල්පති ශ්‍රේණියට අදාළ පාසැල් සඳහා ගැලපෙන පරිදි ශ්‍රේණිධාරී විදුහල්පතිවරු සිටියදී ශ්‍රේණිධාරීන් තුලනය කර පත්කර නොතිබුණි. | අදාළ පාසල් වර්ගය අනුව විදුහල්පති ශ්‍රේණිධාරීන් තුලනය කිරීම සඳහා උපදෙස් සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී ඇත. | නියමිත ස්ථාමාරු ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. |

**1.5.8 ශීර්ෂය 220 - වයඹ පළාත් සමුපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලිබල හා බල ශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සහ තොරතුරු හා තාක්ෂණ කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා.**

**අපේක්ෂිත නිමවුම් (Out Put) ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමූපකාර සංවර්ධන වැඩසටහනෙහි අරමුණ ලෙස පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලැබෙන අරමුදල් උපයෝගී කරගෙන සමූපකාර ව්‍යවසායකත්වය සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ සක්‍රිය කොටස් කරුවෙකු බවට පත්කිරීම දක්වා තිබුණද එම සමස්ථ අරමුණ ඉටුකර ගැනීම වෙනුවට 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.7,700,000 ක වියදමක් දරමින් මහව සමූපකාර සහකාර කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රවණාගාරය පමණක් ඉදිකර තිබුණි. | මහව, ගල්ගමුව, පොල්පිතිගම වැනි කුරුණෑගලින් දුර බැහැර ප්‍රදේශවලට අයත් සමිතිවල නිලධාරීන්ට කුරුණෑගල සහකාර කොමසාරිස් කාර්යාලයෙන් සේවා ලබා ගැනීමට සිදුවීමත් ඔවුන්ගේ කටයුතු අධීක්ෂණයට සමීපතම කාර්යාලයක් නොමැති වීමත් මත 2016 වර්ෂයේදි මහව සහකාර කොමසාරිස් කාර්යාලය ආරම්භ කර ඇත. ආරම්භ කරන ලද කාර්යාලයට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා රැස්වීම් ශාලාවක් නොමැති වීම මත නව ගොඩනැගිල්ල ඉදිකිරීමට 2018 වර්ෂයේ දී සැලසුම් කරන ලදි. | සමස්ථ අරමුණු ඉටුකර ගැනීම පිණිස ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අමාත්‍යාංශය විසින් 'උච්චමුනි' ධීවර ගම්මානයේ නිවාස 135 ක් සහ ධීවර තොටුපලවල් 10 ක් සඳහා 2018 දෙසැම්බර් 21 දින රු.12,207,948 මුදලක් වැය කර සූර්යබල විදුලිකෝෂ කට්ටල ලබා දී තිබුණද 2022 ජනවාරි 20 දින විගණන ක්ෂේත්‍ර පරීක්ෂණ අවස්ථාව වන විට එම සූර්යබල විදුලිකෝෂ අක්‍රීය තත්ත්වයේ විය. | වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලබා දුන් පසු මේ සඳහා පිළිතුරු ඉදිරිපත් කරමි. | ව්‍යාපෘතිය අසාර්ථක වීමට බලපෑ හේතු හඳුනාගෙන ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.8.1 වයඹ පළාත් සමුපකාර සංවර්ධන අරමුදල**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ ජංගම ගිණුමෙහි රු.26,344,048 ක පමණ සාමාන්‍ය ශේෂයක් සමාලෝචිත වර්ෂය පුරා ඌන උපයෝජිතව පැවතුණි. | සමුපකාර සමිති විසින් ණය මුදල් ඉල්ලුම් කරන විට අවශ්‍ය වන කාරක ප්‍රාග්ධන ප්‍රමාණය මෙම ගිණුමේ රඳවා තබා ගන්නා බව කාරුණිකව සඳහන් කරමි. | අවශ්‍ය මුදල් ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | අරමුදල මගින් ලබා දී තිබුණු ණය යටතේ නොගෙවූ ණයවලට අදාළව අධිකරණ ක්‍රියාමාර්ග තුළින් උසාවි දඩ ලෙස අයකර සමුපකාර කොමසාරිස් කාර්යාල වෙත අධිකරණ වෙතින් ලැබී තිබුණු රු.65,504,446 ක මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ සමුකාර සමිති වෙත නිදහස් කර නොතිබුණි. | හලාවත සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයේ රැඳී තිබුණු උසාවි දඩ මුදල් පෙබරවාරි මාසය වන විට නිදහස් කර ඇති බව කාරුණිකව දන්වමි. | මෙම මුදල් අදාළ සමුපකාර සමිති වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය. |

**1.5.9 ශීර්ෂය 221 - වයඹ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | හලාවත හා මහව සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කොට්ඨාශවල සමිති 17 ක සමුච්චිත පාඩුව රු.180,015,752 ක් වූ අතර දිගින් දිගටම පාඩු ලැබූ එම සමිති හඳුනාගෙන ලාභ ලබන තත්ත්වයකට පත් කිරීමට සැලැසුම් සකස්කර නොතිබුණි. | හලාවත හා මහව සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල වලින් පිළිතුරු ලද පසු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුව විසින් සමුපකාර සමිති වෙත අවශ්‍ය මඟපෙන්වීම් ලබා දිය යුතුය. |
| **(ii)** | 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43(I) වගන්තිය හා 1973 සමුපකාර රීති 43(II) අනුව සෑම ලියාපදිංචි කළ සමිතියක්ම සමුපකාර සමිතියේ ශුද්ධ ලාභයෙන් සියයට 10 ට වැඩි නොවන හා රු.5 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් ලෙස සෑම වර්ෂයකම ගෙවිය යුතු වුවත්, හලාවත හා කුලියාපිටිය සහකාර සමුපකාර කොමසාරිස් කාර්යාල බල ප්‍රදේශය තුළ පවතින සමුපකාර සමිති වලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට එලෙස අය විය යුතු දායක මුදල රු.23,665,678 ක් විය. | කුලියාපිටිය හා හලාවත සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලවලින් පිළිතුර ලද පසු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි | පනත අනුව කටයුතු කර අදාළ මුදල් අයකරවා ගත යුතුය. |

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | හලාවත, කුලියාපිටිය හා මහව සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල බල ප්‍රදේශවල සිදුව පැවති රු.170,365,590 ක මූල්‍ය වංචා සම්බන්ධව විමර්ශන කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදු කර නොතිබුණි. | කුලියාපිටිය,මහව හා හලාවත සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලවලින් පිළිතුර ලද පසු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | කඩිනමින් විනය පරීක්ෂණ පවත්වා මුදල් අයකරගැනීමට හෝ විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | සමුපකාර අරමුදලින් ලබාදී තිබුණු ණය යටතේ නොගෙවූ ණයවලට අදාළව අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමේදී අදාළ හිඟ ණය නොගෙවා සිර දඩුවමට ලක් වූ පුද්ගලයන්ට අදාළ ණය මුදල් අය කර ගැනීම පිළිබඳව නිශ්චිත විධිවිධානයක් නොමැති වීම හේතුවෙන් රු.34,855,000 ක එලෙස අය විය යුතු ණය ශේෂයක් විය. | කුලියාපිටිය සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් පිළිතුර ලද පසු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි | ඇප බැඳුම්කරයක් ලබා ගැනීමට හෝ අයකිරීම් සම්බන්ධව විධිවිධාන සකස් කළ යුතුය. |
| **(iii)** | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ (රේඛීය) සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ 2020 මැයි 18 දිනැති අංක ස.සං.මු.වා/10/05 දරණ ලිපිය පරිදි රු.54,077,834 ක් වටිනා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වයඹ පළාතේ සමුපකාර සමිති වෙත නිකුත් කර තිබුණු අතර එයින් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට තවදුරටත් පියවිය යුතු මුදල රු. 18,325,600 ක් විය. | පසුව පිළිතුර ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | අදාළ මුදල් අප්‍රමාදව පියවීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිවිසුම්ගත පිරිවැය රු.14,848,184 ක් වූ මහව සමුපකාර සහකාර කොමසාරිස් කාර්යාලීය රැස්වීම් ශාලාව ඉදිකිරීමට අදාළව ප්‍රමාණ පත්‍රයෙහි සඳහන් ප්‍රමාණය ඉක්මවා රු.3,572,020 ක් ගෙවීම් කිරීම, ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉටුකළ වැඩවල වටිනාකම රු.2,201,796 ක් වීම, ඇස්තමේන්තුගත පිරිවැය රු.2,007,840 ක් වූ වැඩ විෂයන් 30 ක් ඉටුකර නොතිබීම සහ අතිරේක වැඩ විෂයන් 18 ක් වෙනුවෙන් රු.2,471,835 ක් වැය කිරීම වැනි හේතු නිසා ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව සැලසුම් හා ඇස්තමේන්තු සකස්කිරීමෙහි සැලකිය යුතු මූලික ඉංජිනේරුමය කරුණු පිළිබඳ අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතරම අතිරේක වැඩ විෂයයන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකිරීම හේතුවෙන් තරඟකාරී ලංසු ඉදිරිපත් කර ඒ අනුව නිවැරදි කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ද අහිමි වී තිබුණි. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් පිළිතුරු ලැබුණු පසු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | මූලික ඉංජිනේරුමය කරුණු පිළිබඳ අවධානය යොමුකර ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

**1.5.10 ශීර්ෂය 222 - වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 23 කින් වර්ෂ 03 ට වැඩි දීර්ඝකාලීන හිඟ බදු ශේෂය රු.64,631,285 ක්ද , වර්ෂ 2-3 ත් අතර හිඟ බදු ශේෂය රු.28,067,705 ක් විය. | හිඟ බදු මුදල් අයකර ගැනීමට හැකි සියලු ක්‍රියාමාර්ග ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත්, දෙපාර්තමේන්තුව විසිනුත් ගනු ලබන අතර සෑම අවස්ථාවකදීම නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රායෝගික නොවන බැවින් හැකි උපරිමයෙන් මුදල් අය කර ගැනිමට කටයුතු කරනු ඇත. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2017 මාර්තු 08 දිනැති අංක 2019/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වාණිජමය ජලජීවි වගාව සඳහා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරිය වෙත ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හෙක්ටයාර් 39.85 ක පමණ ඉඩම් ප්‍රමාණයක් ලබා දී තිබුණු අතර ඉන් හෙක්ටයාර් 32.38 ක ප්‍රමාණයක් 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තිරණ අනුව ව්‍යාපෘති 200 ක් සඳහා බදු දී තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම මත රජයට අදායමක් අහිමි වී ඇති අතර මේ වන විට එම ඉඩම වල් බිහි වී තිබුණි. | මෙම ඉඩම් කොටසින් අක්කර 50 ක් සමාගමක් වෙත හා අක්කර 29 ක් සමස්ත ලංකා බහුදින ධීවර යාත්‍රා හිමියන්ගේ සමාගම වෙත දීර්ඝ කාලීන බදු ලබා දීමට කටයුතු කරන ලද අතර එම අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු වීම මත එම කටයුතු අත්හිටුවා ඇත. මෙම ඉඩම් කොටස ධීවර අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපතිගේ අංක NQ/1/12/4/33 හා 2022 ජනවාරි 07 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් කර ඇත. | රජයේ ඉඩම් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය - 230 වයඹ පළාත් සෞඛ්‍ය, දේශිය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාවරයා**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 හි පිහිටුවා තිබූ වනිතා සමිති වලින් වනිතා සමිති 414 ක් අක්‍රිය තත්ත්වයෙන් පැවතුණි. | විවිධ හේතු මත හා COVID 19 තත්ත්වය මත අක්‍රිය වී ඇති සමිති නව තාක්ෂණය භාවිතා කරමින් දිරිය වනිතා සමිති ලෙස පවත්වා ගෙන යන ලෙසත්, කඩිනමින් අක්‍රිය සමිති සක්‍රිය කරන ලෙස වනිතා සංවර්ධන නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇත. | අක්‍රිය සමිති සක්‍රිය සමිති බවට පත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.5.12 ශීර්ෂය 231 - වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**(අ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව හා අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | පළාත් මූල්‍ය රීති 83.5 ප්‍රකාරව වවුචර් අනුමත කිරීම හා සහතික කිරීම එකම නිලධාරියකු විසින් සිදු නොකළ යුතු වුවද පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා | මේ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග ඔබ වෙත ඉදිරියේ දී දන්වා එවීමට කටයුතු කරනු ලැබේ. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | කාර්යාලයේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් රු.11,860,4්55 ක් වටිනා වවුචර්පත් 57 ක් අනුමත කිරීම හා සහතික කිරීම සිදුකර ගෙවීම් කර තිබුණි. | | |
| (ii) | පළාත් මූල්‍ය රීති 169.1 ප්‍රකාරව සහතික කරනු ලබන නිලධාරියා විසින් සියලුම වවුචර් සහතික කළ යුතු වුවද, පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වටිනාකම රු.437,091,515 ක් වූ වවුචර්පත් 16 ක් සහතික කර නොතිබුණි. | මේ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග ඔබ වෙත ඉදිරියේ දී දන්වා එවීමට කටයුතු කරනු ලැබේ. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ, සමාලෝචිත වර්ෂයේ පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් රු.1,618,500 ක් වූ පරිගණක නෝට් බුක් (Note Book) 13 ක් හා රු.1,627,200 ක් වූ පරිගණක පද්ධති 12 ක් මිලදීගෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 13 ක් අතර බෙදාහැර තිබුණු නමුත් එම ආයතන තුළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) ක්‍රියාත්මක නොවීය. එමෙන්ම මෙම ව්‍යාපෘතියේ අරමුණුගත කාර්යයන්ට අදාළ නොවන රු.7,796,392 ක් වටිනා උපකරණද මිලදී ගෙන තිබුණි. | මෙම වැඩ විෂය DLI 5 යටතේ 2021 PSSP සැලැස්ම මඟින් අනුමත වී ඇත. ඒ අනුව සඳහන් කර ඇති උපකරණ මිළ දී ගෙන අදාළ රෝහල්වලට බෙදා හැර ඇත. | අරමුදල් අරමුණුගත කාර්යයන්ට යෙදවිය යුතුය. |

**(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වෛද්‍ය සැපයුම් දෙපාර්තමේන්තුව (MSD) වෙතින් 2017 වර්ෂයේ සිට 2021 | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ කල් ඉකුත්වීමට ආසන්න ඖෂධ | මාසික ඖෂධ කමිටු පැවැත්වීමට හා මෘදුකාංග පද්ධති සැම |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය දක්වා කාලය තුළ වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු ඖෂධ වලින් රු.20,359,065 ක් වටිනා ඖෂධ ගුණාත්මක තත්ත්වයෙන් අසමත්ව ද, රු.33,923,933 ක් වටිනාකමැති ඖෂධ කල් ඉකුත්ව ද පැවතුණි. | අවශ්‍යතාවය අනුව වෙනත් ආයතන වලට බෙදාහැරීම් සිදු කර ඇති අතර ඖෂධ කල් ඉකුත්වීම පිළිබඳව විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීමට සියලුම ආයතන ප්‍රධානීන්ට උපදෙස් දී ඇත. | රෝහලකම ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් රෝහල් 44 ක් අතරින් ඖෂධ කල් ඉකුත් වීම පිළිබඳ වෛද්‍ය සැපයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MSMIS) ස්ථාපනය කර පැවතියේ රෝහල් 05 ක පමණක් විය. | අනෙකුත් සෞඛ්‍ය ආයතන සඳහා ද අදියර මට්ටමෙන් මෙම පද්ධතිය ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස කොළඹ වෛද්‍ය සැපයීම් අංශය දැනුවත් කර ඇත. | අදාළ දත්ත පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සතුව රජයේ නිවාස 251 ක් පැවති අතර ඉන් නිවාස 135 ක පදිංචි වී සිටි අතර නිවාස 21ක් වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි. පදිංචියට සුදුසු රජයේ නිවාස 67 ක් භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවති අතර නිවාස 28 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයක පැවතුණි. වෙනත් කාර්යයන් සඳහා යොදවාගෙන ඇති රජයේ නිවාස 21 න් 13 ක් පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතියකින් තොරව වෛද්‍ය කැඳවුම් කාමර ලෙස යොදවාගෙන තිබුණි. | පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතියකින් තොරව නිල නිවාස, වෛද්‍ය කැඳවුම් කාමර ලෙස යොදා නොගන්නා ලෙසට සියලුම ආයතන ප්‍රධානින් දැනුවත් කර ඇති බවත් රෝහල් වල රෝගී සත්කාර සේවාව වෙනුවෙන් අත්‍යවශ්‍ය වෛද්‍ය කැඳවුම් කාමර පවත්වා ගැනීම අවශ්‍ය බැවින් භාවිතයට ගත හැකි නිල නිවාස යොදාගෙන ඇත. | රජයේ නිවාස වෙනත් කාර්යයන් සඳහා යොදවා ගැනීමේදී නිසි අනුමැතියක් ලබාගත යුතුය. |

**(ඉ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුළු භූමි ප්‍රමාණය අක්කර 81 රූඩ් 01 පර්චස් 35 ක් වූ මූලික රොහල් 03 ක හා ප්‍රාදේශීය රෝහල් 24 ක හා ප්‍රාථමික සත්කාර ඒකක 54 ක | ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ වගන්ති අනුව කටයුතු සිදුකරනු ලබන අතර ඇතැම් පවරා ගැනීම් | අදාළ දේපළ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 26 ක හා ආයතන 13ක ඉඩම් ඒකක 120 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | සඳහා අධිකරණයේ නඩු පවතින අතර ඉඩම් අත්පත්කර ගැනීම හා පවරා ගැනීම සංකීර්ණ ක්‍රියාවලියන් වන බව දන්වමි. | |

**(ඊ) කාර්යමණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩල විස්තර අනුව තනතුරු නාම 104 සඳහා අනුමත කාර්ය මණ්ඩලය 8399 දෙනෙකු වූ අතර දැනට සේවය කරන කාර්ය මණ්ඩලය 7023 දෙනෙකු විය. තනතුරු නාම 71 ක් සඳහා පුරප්පාඩු 1744 ක්, හා තනතුරු නාම 11 ක් අතිරික්ත 368 ක විය. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අනුමත තනතුරු අතරින් සෘජුවම පළාත් සභාව මඟින් බඳවා ගැනීම් සිදුකල හැකි වන්නේ ප්‍රාථමික ශ්‍රේණියට අයත් කාර්ය මණ්ඩලය පමණක් වන අතර, නව බඳවා ගැනීම් තාවකාලිකව සිදු නොකරන බැවින් ඒ පිළිබඳ උපදෙස් ලැබුණු පසු අදාළ පුරප්පාඩු සම්පූර්ණ කල හැකි වේ. අනෙකුත් කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර ඇත. සේවා අවශ්‍යතාව මත අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමේ කටයුතු සිදු කරමින් ඇත. | පුරප්පාඩු/ අතිරික්තතා තුලනය කිරීමට හා අවශ්‍ය කාර්යමණ්ඩල බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.13 ශීර්ෂය 232 - වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**කාර්යමණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට විශේෂඥ වෛද්‍ය නිලධාරි තනතුරු 08 ක් අනුමත වී පැවතියද, තනතුරු 04 ක පුරප්පාඩු විය. විශේෂඥ වෛද්‍ය තනතුරු පුරප්පාඩු වීමෙන් පළාතේ ජනතාවට ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළින් ලබාගත හැකිව තිබූ උපරිම සේවාව ලබාගත නොහැකි වී තිබුණි. | විශේෂඥ වෛද්‍ය නිලධාරි ඇතුළු අනෙකුත් වෛද්‍ය නිලධාරින්ගේ බඳවා ගැනීම් හා උසස්වීම් පිළිබඳ සියලු කටයුතු සිදුකරනු ලබන්නේ නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟිනි. | අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 233 - වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවට අයත් වැඩිහිටි නිවාස 23 ක, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන 07 ක ආබාධ සහිත වුවන්ගේ නේවාසික මධ්‍යස්ථාන 06 ක ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් පවරා ගැනීම් කටයුතු අවසන් නොකළ නිවාස හා ඉඩම් 20 ක් එම ඉඩම් පවරා දීමට අදාළ සංවිධාන කැමැත්ත පළ කර නොමැති බැවින් පවරා ගැනීමට නොහැකි අතර, අත්පත් කර ගැනීමේ / පවරා ගැනීමේ කටයුතු සිදු කළ හැකි වනුයේ ඉඩම් 16 ක් සඳහා පමණි. එම ඉඩම් අත්පත් කර ගැනීමේ/ පවරා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |

**1.5.15 ශීර්ෂය - 234 - වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසිවලට යොමුව හා අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනැති කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ 04/2018 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල වටිනාකම තක්සේරු කර දේපල හා පිරියත උපකරණ යටතට ඇතුළත් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති අතර ඉදිරියේදී තක්සේරු කරවා ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. |

**1.5.16 ශීර්ෂය 240 - වයඹ පළාත් මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාවරයා**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| අමාත්‍යාංශයට අයත් නිල නිවසක් කුරුණෑගල නගරාධිපතිතුමාගේ පරිහරණය සඳහා 2021 නොවැම්බර් | නිල නිවාසයට අදාල මාසික කුලිය ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයේ 5 හි සඳහන් වන පරිදි | ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයේ 5 හි සඳහන් |

| | | |
|---|---|---|
| 06 දින ලබාදී තිබූ අතර, එම නිල නිවසට අදාල මාසික කුලිය ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයේ 5 හි සඳහන් විධිවිධාන පරිදි අයකර නොතිබුණි. | වැටුපෙන් හෝ දීමනාවෙන් සියයට 12.5 ක මුදලක් අයකිරීම සඳහා කටයුතු කලද කුරුණෑගල මහා නගර සභාව විසින් එම මුදල අයකර මෙතෙක් මෙම අමාත්‍යාංශය වෙත එවා නොමැත. | විධිවිධාන ප්‍රකාරව නිල නිවාසයේ හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.16.1 වයඹ පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු රු.15,735,000 ක් සහ ඊට අදාල ප්‍රමාද ගාස්තු රු. 2,509,000 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | හිඟ ගාස්තු අයකර ගැනීම අදාළ පාර්ශවයන් ඇතුලත් කර කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු මාර්ගයෙන් අය විමට ඇති හිඟ මුදල් ඉක්මනින් අයකර ගැනිමට කටයුතු කරනු ඇත. | හිඟ මාසික ධාවන සටහන් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2013 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාලව අධිකාරියට ලැබියයුතු පිවිසුම් පත්‍ර ගාස්තු රු.3,201,000 ක් සහ ප්‍රමාද ගාස්තු රු.466,300 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | හිඟ ගාස්තු අයකර ගැනීමට අදාළ පාර්ශවයන් ඇතුලත් කර කමිටුවක් පත්කර ඇති අතර හිඟ වාරික හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | හිඟ මාසික පිවිසුම් පත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාලව අධිකාරියට ලැබිය යුතු අමතර ගමන් වාර ආදායම් ගාස්තු රු.3,419,000 ක් සහ ප්‍රමාද ගාස්තු රු.733,400ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | 2019 සිට 2021 දෙසැම්බර් 31 දක්වා ආයතනයට ලැබිය යුතු අමතර ගමන්වාර ආදායම් වලින් 2022 අප්‍රේල් 30 දිනට රු.312,000 ක් ද ප්‍රමාද ගාස්තු වලින් රු.34,000 ක් ද අය වී ඇත. | ලැබිය යුතු අමතර ගමන් වාර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අධිකාරියේ නව කාර්යාල සංකීර්ණය ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය විගණිත දින දක්වා පළාත් නිශ්චිත ප්‍රතිපාදන රු.61,283,694 ක් හා අධිකාරියේ අරමුදල්වලින් රු.11,810,415 ක් ලෙස රු.73,094,019 ක් වැය කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ ඉඩම පවරාගෙන නොතිබුණි. | අධිකාරිය පවත්වාගෙන යන ඉඩම පවරා ගැනීමේ කටයුතු ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් සිදු කරගෙන යනු ලබයි. | ඉඩම නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.16.2 වයඹ පළාත් නිවාස ඉදිකිරීම් සහ සංවර්ධන අරමුදල**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 අංක 04 දරන වයඹ නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ ප්‍රඥප්තියේ 02 කොටසේ 9 (i) වගන්තියට අනුකූල වන සේ වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල 2012 වර්ෂයේදී පිහිටුවා වයඹ පළාත තුළ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම මූලික අරමුණ වුවත්, අරමුදල විසින් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආරම්භ කර තිබූ ව්‍යාපෘති සංඛ්‍යාව 04 ක් පමණක් වූ අතර ඉන් වැඩ අවසන්ව පැවතියේ ව්‍යාපෘති 02 ක පමණක් විය. | "තිරසර iv" ව්‍යාපෘතියේ කටයුතු අවසන් අදියරේ පවතින අතර "තිරසර v" ව්‍යාපෘතිය යටතේ මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට අරමුදලේ පාලක මණ්ඩලය තීරණය කර ඇත. | අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.17 ශීර්ෂය - 241 - වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 54.35 ක් වූ වාහන 14 ක් වෙනත් ආයතන විසින් ලබාදී තිබුණත් එම වාහන පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | වර්ෂ කීපයක් තිස්සේ අප කාර්යාලය වෙත ලබාදී තිබූ මෙම වාහන ඉදිරියේදී කඩිනමින් පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. | වෙනත් ආයතන මඟින් දෙපාර්තමේන්තුවට ලැබී ඇති වාහන නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.18 ශීර්ෂය 242 - වයඹ පළාත් නිවාස හා ඉදිකිරීම් දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ එක්ව ක්‍රියාත්මක කර තිබූ වයඹ දිරිය නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණයවලට අදාළව ණයගැතියන් 102 කුගෙන් අයවිය යුතු රු.5,340,515 ක හිඟ ශේෂයක් විය. | බැංකුවේ පවතින සාමාන්‍ය ණය අයකර ගැනිමේ ක්‍රමවේදය යටතේ ණය අයකර ගැනිමට කටයුතු කරන අතර, ලිපි ගොනු 16 ක් සඳහා නිතිමය පියවර ගැනීමට ක්‍රියාකර ඇති බව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් මා වෙත දැනුවත් කර ඇත. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.19 ශීර්ෂය 243 – වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාතේ දේශීය හා සම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය හා පැවැත්මට අදාලව වෘත්තීය පුහුනුව ලබාදීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික මෙහෙවර මෙන්ම අරමුණු වුවද, ආධුනිකයින් පුහුණු කිරීම 2019, 2020 සහ 2021 වර්ෂවල පිළිවෙලින් 771 ක්, 360 ක් සහ 247 ක් වශයෙන් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 සියයට 53 ක් සහ 2021 සියයට 68 ක් අඩුවී තිබුණි. | පුහුණුව සඳහා බඳවා ගන්නා ලද ආධුනිකයින්ගේ අඩු වීමට කොරෝනා තත්ත්වය හේතුවෙන් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අංශ වසා දැමීමට සිදු වීම, වෙනත් රැකියාවක් සඳහා ඔන්ලයින් ක්‍රමය භාවිතයෙන් අධ්‍යාපන කටයුතුවල නිරතවීමට ආධුනිකයින් පෙළඹීම සහ කාලයත් සමඟ තරුණ කණ්ඩායම් විවිධ පුහුණු අවස්ථාවන් සඳහා සම්බන්ධ වීම වැනි හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත. | දේශීය හා සම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය හා පැවැත්මට අදාලව වෘත්තීය පුහුණුව ලබාදීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

### 1.5.19.1 වයඹ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 24302 "අමුද්‍රව්‍ය සැපයීම ඇතුළත්ව කාර්මික පාසැල් පවත්වාගෙන යාම පිළිබද වාණිජ අත්තිකාරම් ගිණුම"

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාපහුව වඩු හා පරගම්මන කොහු කර්මාන්තායතන පිහිටි, පිළිවෙලින් රු.800,000 ක් හා රු.600,000 ක් වටිනා ඉඩම්, දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ඉඩම් ලේඛනයෙන් ඉවත් කර තිබුණි. | යාපහුව හා පරගම්මන යන මධ්‍යස්ථාන වල ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවන බැවින් ගිණුම් ප්‍රකාශයේ ඉඩම් ලේඛනයෙන් ඉවත් කළ බව කාරුණිකව දන්වමි. | කර්මාන්තායතනය පිහිටි ඉඩම්, ඉඩම් ලේඛනයට ඇතුළත් කිරීමට හා පවරාගෙන නොමැති ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.16,000,000 ක් වූ උදාරගම මැටි කර්මාන්තායතනය පිහිටි ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්වන අතර, සමාලෝචිත වර්ෂය වන විටත් එය පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම පවරා ගැනීමට අවශ්‍ය ලිපි කටයුතු තව දුරටත් අඛණ්ඩව සිදුවන බව කාරුණිකව දන්වමි. | අදාළ පවරා ගැනීම් කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඇ) | වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළව සමාලෝචිත වසර අවසානයට වසර 10 කට වැඩි කාලයක සිට පුද්ගලයින් 93 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,102,970 ක හිඟ ණය ශේෂයක් විය. | මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත ණය ශේෂ කපා හැරීම පිළිබඳ කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ වාර්තාව මගින් නිර්දේශයන් ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. | ණය ශේෂ නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.19.2 වයඹ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 24303 "අමුද්‍රව්‍ය සැපයීම ඇතුළත්ව පේෂකර්ම මධ්‍යස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම"**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු ණයගැති ශේෂය වූ රු.23,398,164 තුළ වර්ෂ 01 සිට 23 දක්වා කාලයක සිට අයවිය යුතු රු.9,880,130 ක ශේෂයක් ද විය. | පෙර වර්ෂ වල ණය අයකර ගැනීම හෝ කපා හැරීම සම්බන්ධයෙන් මේ වන විට නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. 2013 හා 2014 ණය අයකිරීම සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවතින අතර, ඊට අමතරව නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇත. | ලැබියයුතු ණය ශේෂ නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ජනසළු මධ්‍යස්ථාන හා අලෙවිසැල් පවත්වාගෙන යනු ලබන ස්ථාන 68 කට අදාල ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පවරාගෙන නොතිබුණ අතර මූල්‍ය ප්‍රකාශන අනුව ඒකී දේපළවල අගය රු.23,400,000 ක් විය. | ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීම දැනට වසර කීපයකට පෙර ආරම්භ කර ඇති අතර පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. | ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.20 ශීර්ෂය 244 - වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව**

**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වල්පොල පානීය ජල ව්‍යාපෘතියට අදාළව ළිඳ සෑදීම, වතුර මෝටර් කාමරය සකස් කර මෝටර් සවිකිරීම ජලය රැස් කිරීමේ ටැංකිය ඉදි කිරීම සහ ඒ දක්වා ජලනල එළීම වසර 03 කට පෙර සිදුකර තිබුණු අතර ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය ජලය ලබාදීමට සමාලෝචිත වර්ෂයේ රු.4,308,220 ක් වෙන්ව පැවතියද එකී කාර්යය සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ අපහසුතාවය මත හා අධික ලෙස ද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම හේතු කොටගෙන මෙම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වී ඇත. | ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ප්‍රතිලාභීන්ට පානීය ජලය ලබාදීමට කටයුතු කළ යුතුය. |

**1.5.21 ශීර්ෂය 250 - වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පැවති ධීවර සවිය චක්‍රීය අරමුදල ආරම්භ කිරීමට ප්‍රඥප්තියක් මඟින් හෝ රීති මාලාවක් මඟින් හෝ අනුමැතියක් පළාත් සභාවෙන් ලබාගෙන නොතිබුණි. | මේ වන විට අරමුදල සඳහා කෙටුම්පත් කරන ලද රීතිමාලාව නීති අංශයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා සිටිමි. | ප්‍රඥප්ති/ රීති අප්‍රමාදව සැකසිය යුතුය. |

**1.5.21.1 විෂයය අංක 25002 දරන ව්‍යවසායකත්ව සංවර්ධන සේවා ඒකාබද්ධ අභිජනන ගොවිපල - මාවතගම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාතට උචිත ඉහළ නිෂ්පාදනයක් හා ගුණාත්මක ලක්ෂණ සහිත උසස් ආරයේ කිරි ගව සතුන් බිහිකර ක්ෂේත්‍රයට සැපයීම අරමුණු කරගෙන මාවතගම සත්ත්ව අභිජනන ගොවිපල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය වන විට රු.3,762,207 ක් වැය කර තිබුණද, 2022 පෙබරවාරි 03 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වන විටත් ඉහත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර ගැනීමකින් තොරව අදාළ ගොඩනැගිලි නිශ්කාර්යව පැවතුණි. | මෙම ගොවිපල රාජ්‍ය සහ පුද්ගලික ආයතනයක් සමඟ සහයෝගයෙන් (PPP) ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | සත්ව අභිජනන ගොවිපල ක්‍රියාකාරී ගොවිපලක් වශයෙන් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.21.2 විෂයය අංක 25003 දරන වාරියපොල පටක රෝපණ විද්‍යාගාර වාණිජ අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාරියපොල පටක රෝපණ විද්‍යාගාර වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.1,041,010 ක් වටිනා අමුද්‍රව්‍ය තොගයක් සමාලෝචිත වර්ෂය තුළදී ද භාවිතයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි. | 2021 වර්ෂයේදී විද්‍යාගාරයේ කටයුතු සිදු නොවූ අතර ඒ අනුව අමුද්‍රව්‍ය තොගයේ කිසිදු වෙනසක් සිදු නොවුනි. | අමුද්‍රව්‍ය තොගය කල් ඉකුත්වීමට පෙර ඵලදායී ලෙස යොදාගත යුතුය. |

### 1.5.21.3 වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීම් නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට අධිකාරියේ හිඟ ආදායම රු.43,475,845 ක් වූ අතර ඒ තුළ වසර 05 කට වඩා පැරණි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.2,150,000 ක ශේෂයක් ද විය. | ප්‍රාදේශීය ලේකම්, ආරච්චිකට්ටුව වෙතින් අයවිය යුතු රු.114,850 ක මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීම් ගණනාවක් මේ වන විට කර ඇති අතර "ඊ සෙවන් ලංකා" පුද්ගලික සමාගම වෙතින් අය විය යුතු රු.480,000 ක මුදල අයකර ගැනීම පිළිබඳව ඇති ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා වයඹ ප්‍රධාන ලේකම් කාර්යාල නීති අංශය වෙතින් විමසා ඇත. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් 2007 වර්ෂයේ ආරම්භ කරන ලද මත්ස්‍ය සැකසුම් ව්‍යාපෘතිය සඳහා මිලදීගත් දැනට ඌන උපයෝජිතව පවතින වත්කම්වල පිරිවැය රු.3,909,360 ක් වන අතර, එකී වත්කම්වල 2014 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.1,850,000 ක් වූ අතර, වර්තමාන තක්සේරු වටිනාකම ගණනය කර නොතිබුණි. | මෙම අධිකාරියේ නිශ්ක්‍රීය වත්කම් සම්බන්ධ ඉදිරි කටයුතු කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ වාර්තාවේ නිර්දේශය සහ ඌන උපයෝජිත වත්කම් තක්සේරු වාර්තාවේ නිර්දේශය මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මෙම උපකරණ වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත භාර දී ඇත. | වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට හෝ අවශ්‍ය වෙනත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.22 ශීර්ෂය 251 - වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් වසර ගණනාවක සිට භාවිතයෙන් ඉවත් කර ඇති වාහන 10 ක් විධිමත් පරිදි ආයතනයෙන් බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ දී අපහරණය සඳහා ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර එම කටයුතු අවසානයේ නිසි පරිදි ලේඛන වලින් අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිශ්කාර්ය වාහන විධිමත් පරිදි ආයතනයෙන් බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.22.1 වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂයය අංක 25102 දරන "ගොවිපල කටයුතු මෙහෙයවීම හා බිත්තර වී සැපයීම" සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.5,476,589 ක් වූ අතර, ඊට අදාළ ණයගැති කාල විශ්ලේෂණයක් නොතිබුණි. | මේ වසරේ සිට ණයගැති කාල විශ්ලේෂණය ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසට ගොවිපල් දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ණයගැති කාල විශ්ලේෂණ පිළියෙල කළ යුතුය. |
| (ආ) | 1918 වර්ෂයේ පමණ ආරම්භ කර ඇති අක්කර 104 ක පමණ විශාලත්වයෙන් යුතු වාරියපොල රජයේ ගොවිපල පිහිටි ඉඩම වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරාගෙන නොමැති අතර, වර්තමානය වන විට ගොවිපල භූමියේ වෙනත් රජයේ කාර්යාල 07 කට ගොඩනැගිලි හා කාර්යාල ඉදිකිරීම සඳහා ඉඩම් වෙන්කරදී තිබුණද, එම ඉඩම් ප්‍රමාණ පිඹුරුපත් මඟින් ලිඛිතව පවරාදී නොතිබුණි. | ගොවිපල භූමියේ අයිතිය පවරාගැනීම සඳහා මේ වන විට මැණුම් කටයුතු වෙනුවෙන් ඉල්ලීම් ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාරියපොල රජයේ ගොවිපලේ රුපියල් මිලියන 4 ක් වටිනා 'ජොන් ඩියර්' සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රයක් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නිශ්ක්‍රීයව පැවතුණි. | මෙම යන්ත්‍රය නිකවැරටිය බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයට භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | වත්කම් ප්‍රයෝජනවත් කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතුය. |

**1.5.23 ශීර්ෂය 252 - වයඹ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අඳ ගව ව්‍යාපෘතිය යටතේ සතුන් මූලිකව ලබාගත් ගොවීන් විසින් අඳ කාලසීමාව (වසර 4) ඉක්මවූ පසු අනුගාමී ගොවියෙකු වෙත නැවත සතකු ලබාදිය යුතු වුවද, අලව්ව සහ වාරියපොල පශු වෛද්‍ය කාර්යාල බල ප්‍රදේශවල එසේ ලබාදී නොමැති අවස්ථා පැවතුණි. එමෙන්ම ඒ වෙනුවෙන් සත්ව වටිනාකම් ලබාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | අඳ ගව ව්‍යාපෘතියට අදාලව පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් පවතින ගැටළු නිරාකරණය කර අඳයෙන් නිදහස් කිරීමට හෝ සාධාරණ හේතු පවතී නම් පොතෙන් කපා හැරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | ව්‍යාපෘතියේ අරමුණු අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සමාලෝචිත වර්ෂය තුළ රු.1,469,000 ක් වැය කරමින් කිරි ආශ්‍රිත නිෂ්පාදන සකස් කරනු ලබන නිෂ්පාදනාගාරයේ යන්ත්‍ර ක්‍රියාකරවීමේ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා කටයුතු කර තිබෙන නමුත්, හෝමෝජිනයිසරය යන්ත්‍රයෙහි Starter කොටස අක්‍රියවීම හේතුවෙන් යන්ත්‍රය ක්‍රියාකිරිමට නොහැකිවී තිබුණි. | මේ වන විට හෝමෝජනයිසර් යන්ත්‍රයේ "starter"කොටස අලුතින් යොදා පද්ධතිය ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ පවතින බව සඳහන් කරමි. | මුළු පද්ධතියම ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතුය. |

## 1.5.24 ශීර්ෂය - 253 - වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**ප්‍රමාද වූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.7,945,669 ක් වූ ව්‍යාපෘති 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,128,892 ක් වැය කර තිබුණද එම ව්‍යාපෘති නිමකර නොතිබුණි. | පැවති අධික වර්ෂාව නිසා වාරි ව්‍යාපෘති ජලයෙන් පිරියාම හා කොරෝනා වසංගතය හේතුවෙන් මෙම ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වී ඇත. | කාල රාමුව තුළ ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.25 ශීර්ෂය 260 - වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය

**ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් සංකේත අංක 1002.04.03 දරන රා තැබෑරුම් රේන්දය හා අංක 1002.04.05 දරන මෙරට මත්පැන් බලපත්‍රවලට අදාළ වර්ෂ 03 කට වඩා පැරණි හිඟ ආදායම රු.11,207,011 ක් විය. | රු.2,416,668 ක් වූ රා තැබෑරුම් රේන්ද ආදායමක් කපා හැරීමට සුරාබදු කොමසාරිස්ගේ නිර්දේශ සඳහා යොමු කර ඇති අතර, රු.7,990,343 ක හිඟය සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. රු.800,000 ක් වූ මෙරට මත්පැන් බලපත්‍ර ආදායම ලැබිය යුතු ආයතනය මේ වන විට වසා ඇති අතර ඒ පිළිබඳ සුරාබදු කොමසාරිස්ගෙන් වාර්තාවක් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමට තීරණය කර ඇත. | හිඟ ආදායම් නොපමාව අයකරගත යුතුය. |

**1.5.26 ශීර්ෂය 261 - වයඹ පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව**

**මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරන ලද කාර්යමණ්ඩල වාර්තාවට අනුව අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරු 20 ක් අනුමත කර තිබුණු නමුත්, විගණන කටයුතු සිදු කිරීමට සුදුසුකම්ලත් නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කරගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය මේ වන විට සකස් කර අනුමැතිය ලබා ගැනීමේ අවසන් අදියරේ පවතී. එය අනුමත වූ පසු අදාල නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරමි. | බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණනයට භාජනය වියයුතු ආයතන 1840 ක් පමණක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී ආයතන 315 ක විගණන කටයුතු සිදු කිරීමට සැලසුම් කර, පසුව එය ආයතන 293 ක් ලෙස සංශෝධනය කර තිබුණි. ඒ අනුව විගණනයට ලක්විය යුතු ආයතන අතරින් අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත්ව පැවතියේ සියයට 16 ක පමණ අවම ප්‍රමාණයක් විය. | 2021 වර්ෂය තුළ විගණන රාජකාරි සඳහා සිටින නිලධාරීන් ප්‍රමාණය 25 ක් වූ බැවින් වසරක් තුළදී මෙම සියලුම ආයතන ආවරණය වන පරිදි විගණන කටයුතු සිදු කිරීම අපහසු විය. ආයතන 315 ක විගණන කටයුතු කිරීමට සැලසුම් කළද කොවිඩ් වියසනය සමඟ නිලධාරීන් ආයතනවලට යොමු කිරීමට නොහැකි නිසා එය ආයතන 293 ක් ලෙස සංශෝධනය කරන ලදී. | අභ්‍යන්තර විගණනය පුළුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.27 ශීර්ෂය 262 - වයඹ පළාත් ප්‍රතිපත්ති, සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | වයඹ පළාත සඳහා 2020 සිට 2024 දක්වා පස් අවුරුදු මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා ලද ප්‍රතිපාදන වලින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.9,820,784 ක වියදම් දරා තිබුණද, එයින් සියයට 59 ක් හෙවත් රු.5,813,984 ක පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ වැඩමුළු හා ක්ෂේත්‍ර නිරීක්ෂණ හා ප්‍රවාහන, ලිපි ද්‍රව්‍ය හා | වයඹ පළාතට අදාළව දැක්ම පදනම් කරගත් ඒකාබද්ධ තිරසර සංවර්ධන සැලැස්ම 2020 - 2024 සකස් කිරීමේදී වඩාත් ප්‍රායෝගිකව සකස් කිරීම සඳහා ග්‍රාමීය ප්‍රාදේශීය දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ වැඩමුළු පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලය මඟින් සැලැස්ම සකස් කර එහි ඉංග්‍රීසි පිටපත ලබාදුන් අතර, එහි සිංහල | සැලැස්ම ක්‍රියාත්මක කිරීමට හා සිංහල පිටපත් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනෙකුත් වියදම් සඳහා වැයකර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සංවර්ධන සැලැස්ම සිංහල භාෂාවට පරිවර්ථනය කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | පිටපතක්ද ලබාදීමට කටයුතු කරන බව දැනුම් දී තිබුණි. | |
| **(ii)** | පළාත් ආයෝජන වැඩසටහන සඳහා අන්තර්ජාලය පදනම් කරගත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වයඹ ප්‍රධාන ලේකම් විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අංශයේ අධ්‍යක්ෂ සමඟ 2018 සැප්තැම්බර් 01 එළැඹි ගිවිසුම අනුව 2019 මාර්තු 31 දින වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ව්‍යාපෘතිය නිම කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් දරා ඇති වියදම රු.3,803,156 ක් විය. | රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාලීය කටයුතු සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, අන්තර්ජාලය පදනම් වූ විශේෂිත තාක්ෂණික ක්‍රියාකාරකමක් වන මෙය අවසන් කිරීමට නොහැකි විය. | අදාළ තොරතුරු කළමනාකරණ පද්ධතිය කඩිනමින් සකස් කළ යුතුය. |

**1.5.28 ශීර්ෂය 263 - වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

**(අ) ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම රු.124,031,163 ක් වූ අතර, එයින් වර්ෂයකට වඩා පැරණි අය විය යුතු ශේෂය රු.103,692,694 ක් විය. | අතිරේක මුද්දර ගාස්තු රු.මිලියන 50.77 ක හිඟ ශේෂයක් පැවැති අතර ඉන් රු.මිලියන 36.3 ක් සඳහා නඩු පවරා ඇති අතර රු.මිලියන 9.66 ක් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන කපාහැර ඇත. ව්‍යාපාර පිරිවැටුම් බදු රු.29,878,804 ක ශේෂයෙන් රු.මිලියන 9.9 ක මුදලක් කපා හැරීම හා ඉතිරි මුදල් අප්‍රමාදව අය කිරීමට කටයුතු කරමි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

**(ආ) කාර්යමණ්ඩල පරිපාලනය**

**-----------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ------------------------ | ------------------------------------- | ------------ |
| පළාත් ආදායම් කොමසාරිස් තනතුර 2018 මැයි 18 දින සිට සහ පළාත් ආදායම් නියෝජ්‍ය කොමසාරිස් තනතුරු දෙක 2009 අප්‍රේල් 08 සහ 2009 අගෝස්තු 12 දින සිට පුරප්පාඩුවී පැවතුණි. | පුරප්පාඩුව පවතින පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා 2020 සැප්තැම්බර් 15 දක්වා කොන්ත්‍රාත් පදනම මතද එදින සිට මේ වන තෙක් ජ්‍යෙෂ්ඨ තක්සේරු නිලධාරියෙකු තනතුරේ රාජකාරි ඉටුකිරීමේ පදනම මත ද කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා නිත්‍ය පත්කිරීම් කිරීම කඩිනමින් කළ යුතුය. |